# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2087/17 - 2018 සැප්තැම්බර් මස 04 වැනි අඟහරුවාදා - 2018.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

#### මධ්‍යම පළාත් සභාව

මධ්‍යම පළාත් සභාවේ යෝජිත "2018 අංක 02 දරන මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම" ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාතේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් ප්‍රඥප්තියේ කෙටුම්පත මහජනතාවගේ අදහස් විමසීම සඳහා පහත පළ කරමි.

මෙම දැන්වීම පළවීමෙන් දින 10 ක් ඉක්මවා ගිය පසු මෙම කෙටුම්පත අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10 ක් තුලදී එකී කරුණු ලිඛිතව පහත ලිපිනයට මා වෙත දැනුම් දිය යුතුය.

**තිළිණ බණ්ඩාර තෙන්නකෝන්,**
මධ්‍යම පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු, වනිතා,
ග්‍රාමීය සංවර්ධන හා කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍ය.

තැ. පෙ. අංක 41,
ගැටඹේ,
පේරාදෙණිය.


1A - PG 4200 — 107 (2018/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම ප්‍රඥප්තිය

මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණයේ කටයුතු පරිපාලනය, නඩත්තු කිරීම හා ක්‍රීඩා සංවර්ධනය සඳහා මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ පදනම පිහිටුවීම පිණිස මෙම ක්‍රීඩාංගනය වෙනුවෙන් මධ්‍යම රජයේ ක්‍රීඩා අමාත්‍යාංශය සහ පළාත් සභාව ගිවිසගෙන ඇති ගිවිසුම පරිච්ඡින්න කිරීම සඳහා සහ ඊට අනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සලසන්නාවූ ප්‍රඥප්තියකි.

මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ 2018 අංක 02 දරන මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වන ලබන අතර මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු පසු විෂයභාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

### I කොටස

### මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම පිහිටුවීම

දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම පිහිටුවීම.

2. මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම පිහිටුවනු ලැබේ.

3. පදනමේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

1. ක්‍රීඩා සංකීර්ණය මනාව පරිපාලනය හා නඩත්තුව
2. ක්‍රියාශීලී නිරෝගිමත් ජනතාවගේ බිහිකිරීමට සහයවීම
3. ක්‍රීඩාව දිරිගැන්වීම හා වැඩි දියුණු කිරීම
4. ක්‍රීඩාව දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම
5. ක්‍රීඩාංගනය සඳහා පැමිණෙන ජනතාවට සතුටින් හා විනෝදයෙන් ගත කිරීමට අවස්ථාව සලසා දීම.
6. දෙස් විදෙස් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කර ජාත්‍යන්තර තලයට ගෙනයාම
7. ක්‍රීඩාවට සම්බන්ධ සියලුම තලයේ නිලධාරීන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනයට පහසුකම් සැපයීම.
8. මතු පරපුර වෙනුවෙන් ක්‍රීඩා සංකීර්ණය ආරක්ෂා කර පවත්වාගෙන යාම.
9. ග්‍රාමීය ක්‍රීඩකයාට ජාත්‍යන්තර මට්ටමේ ඇත්දකීම් ලබා ගැනීමට පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බිහි කිරීම.
10. ක්‍රීඩා සංකීර්ණයේ අවට ජනතාවගේ ආදායම් මට්ටම වැඩි කිරීම හා රැකියා අවස්ථාවන් පුළුල් කිරීම.
11. දුර බැහැර ක්‍රීඩකයන්ට නේවාසිකව රැඳී සිට ක්‍රීඩා කුසලතා සංවර්ධනයට අවස්ථාව ලබා දීම.

නෛතික පුද්ගලභාවය.

4. පදනම එහි නමින් නඩුපැවරීමට හා පවරනු ලැබීමට යටත් පොදු මුද්‍රාවක් සහිත නෛතික පුද්ගල භාවයක් සහ අවිච්ඡින්න පැවැත්මක් සහිත ආයතනයක් වන්නේ ය.

පාලක මණ්ඩලයේ සංයුතිය.

5. (1) පදනමේ කටයුතු මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන පාලක මණ්ඩලය විසින් පරිපාලනය හා කළමනාකරණය කරනු ලැබේ.

(2) මණ්ඩලයේ සංයුතිය නිල බලයෙන් පත්වන පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

I. මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්
II. මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්
III. මධ්‍යම පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)
IV. මධ්‍යම පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)
V. ප්‍රාදේශීය ලේකම් කුණ්ඩසාලේ
VI. මධ්‍යම පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ
VII. මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන ක්‍රීඩා අධ්‍යක්ෂ

(3) මණ්ඩලයේ සියලුම සාමාජිකයන් පළාත් ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු අතර මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් සභාපතිවරයා වශයෙන් ද පළාත් ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් මණ්ඩලයේ ලේකම් වශයෙන් ද පත්කරනු ලැබිය යුත්තේ ය.

මණ්ඩලයේ රැස්වීම සහ සන පූර්ණය.

6. (1) මණ්ඩලය විසින් මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දින සිට මාස 06 ක කාල සීමාව තුළ සෑම මසකට වරක්ම රැස්විය යුතු අතර ඉන්පසුව මාස තුනකට වරක් හෝ අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලය තීරණය කරනු ලබන පරිදි රැස්විය යුත්තේ ය.

(2) මණ්ඩලයේ සෑම රැස්වීමක් සඳහාම සන පූර්ණය අවම වශයෙන් සාමාජිකයින් තුනක් විය යුතු ය.

පොදු මුද්‍රාව.

7. පදනමේ පොදු මුද්‍රාව මණ්ඩලයේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර පදනම වෙනුවෙන් අත්සන් කරනු ලබන සෑම ලේඛණයක් සඳහාම සභාපතිවරයා සහ ලේකම්වරයා විසින් අත්සන් තබා පොදු මුද්‍රාව තැබිය යුත්තේ ය.

පදනමේ කාර්යයන් හා බලතල.

8. පදනමේ බලතල හා කාර්යයන් පහත පරිදි වේ.

(1) මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලන හා නඩත්තු කටයුතු සම්බන්ධ තීරණ ගැනීම හා එය පළාත් සභාව සතු දේපලක් වශයෙන් සුරක්ෂිත කරමින් සංවර්ධනය කිරීම.

(2) මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණයේ ආකෘතිමය වශයෙන් වෙනස්කම් සිදු කිරීම හා වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම.

(3) නව ආදායම් මාර්ග හඳුනාගැනීම හා ප්‍රවර්ධනය කිරීම.

(4) මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණයේ කාර්යය මණ්ඩලයේ පරිපාලන කටයුතු අධීක්ෂණය හා මෙහෙයවීම.

(5) මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණය පරිපාලනය හා නඩත්තු කටයුතු පහසු කිරීම සඳහා ආදායම අනු කමිටුව, සැලසුම් අනු කමිටුව නඩත්තු අනු කමිටුව, ක්‍රීඩා අනු කමිටුව හා වෛද්‍ය අනු කමිටුව ආදී වශයෙන් අවශ්‍ය අනු කමිටු පිහිටුවීම සහ ඊට අදාළ නීති රීති, රෙගුලාසි හා මගපෙන්වීම ලබා දීම.

(6) චංචල සහ නිශ්චල දේපල අත්පත් කර ගැනීම, විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයේ බැහැර කිරීම සිදු කිරීම.

(7) 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ ප්‍රතිපාදනයන්ට අනුකූලව රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන, පුද්ගල මණ්ඩල හෝ තනි පුද්ගල ආදියෙන් නිශ්චල හෝ චංචල දේපල වශයෙන් ලැබෙන ත්‍යාග සහ ප්‍රදානයන් පිළිගැනීම.

(8) මෙම ප්‍රඥප්තියෙන් අරමුණු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ගිවිසුම් සඳහා එළඹීම.

(9) පදනමේ කටයුතු පරිපාලනය සඳහා අවශ්‍ය තනතුරු සහ සේවක සංඛ්‍යාව හඳුනාගැනීම, සේවක පිරිස බඳවා ගැනීම, පත් කිරීම, උසස් කිරීම, විනය පාලනය සහ සේවයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීම.

(10) දිගන ක්‍රීඩා සංකීර්ණ පදනම ලාභ ලබන තත්වයට පත් වන අවස්ථාවකදී පාලක මණ්ඩලයට හා අනු කමිටුවලට ගෙවිය යුතු දීමනා හෝ පාරිශ්‍රමිකයන් ගෙවීම සම්බන්ධ තීරණ ගැනීම.

(11) කාර්යය මණ්ඩලයේ වැටුප් හා පාරිශ්‍රමිකයන් තීරණය කිරීම.

(12) ක්‍රීඩා පුහුණු පාඨමාලා සැලසුම් කිරීම, පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා විවිධ පාඨමාලා සඳහා ප්‍රතිලාභීන් පුහුණු කිරීමට කටයුතු කිරීම.

(13) ක්‍රීඩා විද්‍යායතනය පිහිටුවීම ආදී ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා අවශ්‍ය පියවරයන් ගැනීම.

(14) පළාත් තුළ පාසල් හා ක්‍රීඩා සංවිධාන සඳහා ක්‍රීඩා පිටියේ පහසුකම් ලබාගැනීමට කරන ඉල්ලීම් පිළිබඳව සලකා බැලීම.

9. පදනමේ බලතල හා කාර්යයන් පාලක මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

පාලන වාර්තාව.

10. සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර පදනමේ පරිපාලන, සංවර්ධන හා මූල්‍ය ප්‍රගතිය ඇතුළත් පාලන වාර්තාවක් විෂයභාර අමාත්‍යවරයා විසින් පළාත් සභාවේ සභාගත කළ යුතු වන්නේ ය.

## II කොටස

## කාර්යය මණ්ඩලය

කාර්ය මණ්ඩලය.

11. (1) පදනමේ ප්‍රධාන පරිපාලන නිලධාරියා, කළමණාකරු වන්නේය. ඔහු ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සහකාර අධ්‍යක්ෂවරයෙකු අතුරින් කෙනෙකු විය යුතු ය. එම අය පත්කිරීම පාලක මණ්ඩලයේ එකඟතාවය මත සභාපතිවරයා විසින් පත් කළ යුතුය. මෙම තනතුර සඳහා සුදුසු අවස්ථාවකදී ස්ථිරව කෙනෙකු බඳවා ගැනීමට පාලක මණ්ඩලයට හැකිය.

(2) කළමනාකරුට සහාය වීම පිණිස කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යා හැකි අතර එම කාර්යය මණ්ඩලයේ ක්‍රීඩා පුහුණුකරුවන් සහ ක්‍රීඩා නිලධාරීන් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්යය මණ්ඩලයෙන් පත් කළ යුතු අතර සෙසු කාර්යය මණ්ඩලය පාලක මණ්ඩලය විසින් බඳවා ගැනීම් පරිපාටියට අනුව සිදුකළ යුතු ය.

(3) මෙම පදනමට බඳවාගත යුතු සේවක සංඛ්‍යාව හා ඔවුන් බඳවා ගැනීමට අදාළ කාර්ය පටිපාටිය සඳහා පාලක මණ්ඩලය විසින් පටිපාටියක් සකස් කර අනුමත කරවාගත යුතු ය.

## III කොටස

## උපදේශන කමිටුව

උපදේශක කමිටුවේ සංයුතිය.

12. 12:1 පාලක මණ්ඩලයේ කාර්යයන් සඳහා අවශ්‍ය අවස්ථාවකදී, උපදෙස් ලබාදීම සඳහා උපදේශක කමිටුවක් පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලැබිය යුත්තේ ය.

12:2 උපදේශක කමිටුවේ සංයුතිය පහත පරිදි වේ :-

I. පළාත් සභාවේ ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා
II. පළාත් සභා මන්ත්‍රීවරුන් 4 දෙනෙකු

12:3 ආණ්ඩුකාරවරයා විසින් හේතු දක්වා ඉවත් කරනු නොලැබුවහොත් උපදේශක කමිටුවේ ආයු කාලය වසර 03 කි. විෂයභාර අමාත්‍යවරයාට මෙම කාලය අදාළ නොවේ.

12:4 උපදේශක කමිටුවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ තනතුරෙන් ඉවත් කිරීමෙන් හෝ මිය යාමෙන් ඇතිවන පුරප්පාඩුවට ආණ්ඩුකාරවරයා විසින් වෙනත් මන්ත්‍රීවරයෙකු පත්කරනු ලැබිය යුත්තේ ය.

කාර්යයන් හා බලතල.

13. උපදේශක කමිටුවේ කාර්යයන් හා බලතල

(1) පාලක මණ්ඩලය විසින් උපදෙස් ඉල්ලා සිටි අවස්ථාවක උපදෙස් ලබා දීම.
(2) මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණය පුළුල් කිරීමට අවශ්‍ය දේශීය හා විදේශීය මූල්‍ය පහසුකම් සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම.
(3) ක්‍රීඩා කුසලතා සංවර්ධනය කිරීම සඳහා දෙස් විදෙස් විශේෂඥ දැනුම ලබා දීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.
(4) ක්‍රීඩා අනුකමිටු වල ප්‍රගතිය විමසීම හා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ඇගයීම.
(5) පාලක මණ්ඩලයේ මත ගැටුමකදී අනුශාසකත්වය දැරීම.

උපදේශක කමිටුවේ රැස්වීම්.

14. උපදේශක කමිටුවට අවශ්‍යයැයි හැඟෙන අවස්ථාවලදී හා පාලක මණ්ඩලය විසින් ඉල්ලීමක් කළ විට රැස්විය හැකිය.

උපදේශක කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය.

15. පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් උපදේශක කමිටුවේ රැස්වීම ඇතුළු අනෙකුත් කටයුතු සම්බන්ධීකරණය කළ යුතු ය.

## IV කොටස

### පදනමේ ගිණුම

16. (1) පදනම් සඳහා ''මධ්‍යම පළාත් දිගන ක්‍රීඩා සංකීර්ණ හා ක්‍රීඩා සංවර්ධන පදනම'' නමින් ගිණුමක් පැවතිය යුතු ය.

(2) ගිණුම සඳහා අරමුදල් ලැබීමේ ප්‍රභවයන් පහත පරිදි වේ :-

I. මධ්‍යම රජයෙන් ලැබෙන අරමුදල්
II. පළාත් සභා අරමුදලින් ලැබෙන අරමුදල්
III. පදනම මගින් උපයා ගන්නා ආදායම
IV. පවත්නා නීතියට යටත්ව රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වලින් ලැබෙන ආධාර හා පරිත්‍යාග
V. පුද්ගල හෝ පුද්ගල මණ්ඩල වලින් ලැබෙන ආධාර හා පරිත්‍යාග

17. පහත කාර්යයන් සඳහා ගිණුමේ මුදල් භාවිතා කළ හැකිය :- ගිණුමෙන් මුදල් වියදම් කිරීම.

(1) ක්‍රීඩා සංකීර්ණයේ පරිපාලන හා නඩත්තු කටයුතු.
(2) සේවක වැටුප් හා පාරිශ්‍රමික ගෙවීම සඳහා
(3) චංචල හා නිශ්චල දේපළ මිලදී ගැනීම සඳහා
(4) සංකීර්ණය පුළුල් කිරීමේ කාර්යයන් සඳහා
(5) සේවක මණ්ඩලයට තම විෂය පථයට ගැනෙන පාඨමාලා, දේශීය හා විදේශීය පුහුණුවලට සහභාගී වීම සඳහා.
(6) පදනමේ කාර්යයන් ඉටුකර ගැනීමට දැරීමට සිදුවන අනෙකුත් වියදම්.

18. ගිණුම රජයේ පිළිගත් බැංකුවක පවත්වාගෙන යා යුතු ය.

19. ගිණුමෙන් මුදල් ආපසු ලබා ගැනීමේදී පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබ න තිදෙනෙකුගෙන් යුත් කමිටුවක නිර්දේශය මත පාලක මණ්ඩලයේ ලේකම් හෝ බලය පැවරූ නිළධාරියෙකුගේ සහ කළමණාකරුගේ අත්සනින් ගිණුම මෙහෙයවිය යුතු ය. ගිණුමෙන් මුදල් ආපසු ගැනීම.

20. ගිණුම් වර්ෂය සෑම වර්ෂයකම ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා වේ.

21. සියලු ආදායම් හා වියදම් ගිණුම්ගත කළ යුතු අතර ගිණුම් වාර්තා මාසිකව පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය. ගිණුම් වාර්තා.

22. ගිණුම විගණකාධිපතිවරයාගේ වාර්ෂික විගණනයට යටත් විය යුතු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයටද භාජනය කළ යුතු ය. ගිණුම් විගණනය.

## V කොටස

### සාමාන්‍ය විධිවිධාන

23. උපදේශක කමිටුව හෝ පාලක මණ්ඩලය විසින් ගනු ලබන තීරණයකින් අතෘප්තිමත් වන පාර්ශවයකට අභියාචනාවක් මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කළ හැකිය. ආණ්ඩුකාරවරයාගේ තීරණය අවසානාත්මක වන්නේය :- අභියාචනා කිරීම.

24. (1) ප්‍රඥප්තිය මත සාදනු ලබන රෙගුලාසිවල පොදුභාවයට හානියක් නොවන පරිදි පහත කාරණා මත රෙගුලාසි පැනවීමේ බලය ඇමතිවරයා සතු වන්නේය :-

(1) ක්‍රීඩා අනු කමිටු පිහිටුවීම, ස්වායේ බලතල, කාර්යයන් ඒවායේ ව්‍යවස්ථාවන් හා සම්බන්ධ විධිවිධාන
(2) ක්‍රීඩා සංකීර්ණය බාහිර පුද්ගලයින් සහ ආයතන වෙත වෙන්කිරීම හා සම්බන්ධ විධිවිධාන
(3) ක්‍රීඩා පාඨමාලා හඳුන්වාදීම සම්බන්ධ විධිවිධාන
(4) ක්‍රීඩා සංකීර්ණය පරිහරණය කරන්නන් හා සම්බන්ධ විධිවිධාන
(5) ක්‍රීඩා සංකීර්ණය වෙන් කිරීමේ ගාස්තු තීරණය කිරීමේ විධිවිධාන

(2) පදනමේ බලතල හා කාර්යයන් ඉටු කිරීමේදී අවශ්‍ය වන්නාවූ අනෙකුත් කාරණා සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය.

25. අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළකළ යුතු අතර ගැසට් පත්‍රයේ පළ කළ දින සිට මසක් තුළ පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් රෙගුලාසියක් එකී අනුමත දිනයේ සිට එකී රෙගුලාසි යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හෝ ක්‍රියාවන්ට හානියක් නොවන පරිදි පරිච්චින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. පරිච්චින්න කරන ලද රෙගුලාසියක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුත්තේ ය.

26. මෙම ප්‍රඥප්තියට ඇතුලත්වන සියලු ම සාමාජිකයන් සහ සියලුම නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහයට අර්ථානුකූලව සහ එකී කාර්යයන් සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය. මෙම පදනම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන අනුව අර්ථ නිරූපනය කරනු ලැබිය යුතු ය.

වැරදි හා දඬුවම්.

27. ප්‍රඥප්තියේ යම් විධිවිධානයක් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ යම් රෙගුලාසියක යම් විධිවිධානයක් කඩ කරනු ලබන යම් තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය මත වරදක් සිදු කරනු ලබන අයෙකු වන අතර නිසි අධිකරණයකදී පවත්වනු ලබන නඩු විභාගයකදී වරදකරු කිරීමේදී රු. 5000/- ක් නොඉක්මවන දඩයකට හෝ මාස 03 ක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

28. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා අනුමත කරනු ලැබූ දිනයේ සහ ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වීමත් සමග මධ්‍යම රජයේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් ගිවිසගන්නා ලද මෙම ක්‍රීඩාංගනයට අදාළ ගිවිසුම පරිච්චින්න වන්නේය.

## VI කොටස

### අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය

29. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

''දිගන ක්‍රීඩා සංකීර්ණය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ ගෘහස්ථ ක්‍රීඩාගාරය, පිහිණුම් තටාකය, එලිමහන් ක්‍රීඩා පිටිය, ප්‍රේක්ෂකාගාරය, ශක්ති වර්ධන ඒකකය, ආපන ශාලාව සහ ඒ මත ඉදිකරනු ලැබිය හැකි සියලු ආකාරයේ ඉදිකිරීම් වැඩි දියුණු කිරීම සහ ක්‍රීඩා සංකීර්ණයට අදාළ ඉඩම ද වේ.

''පළාත් සභාව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ මධ්‍යම පළාත් සභාවයි.

''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් අදහස් කෙරෙන්නේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයායි.

''අමාත්‍යවරයා'' යන්නෙන් අදහස් කෙරෙන්නේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයායි.

''ප්‍රධාන ලේකම්වරයා'' යන්නෙන් අදහස් කෙරෙන්නේ මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්වරයායි.

''ලේකම්'' යන්නෙන් අදහස් කෙරෙන්නේ මධ්‍යම පළාත් සභාවේ ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයායි.

''පළාත් අධ්‍යක්ෂ යනු'' මධ්‍ය පළාත් සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂවරයා වේ.

''දිගන ක්‍රීඩාංගනය'' පළාත් ක්‍රීඩා විෂයභාර අමාත්‍යාංශයට අනුබද්ධ පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අනුබද්ධිත අංශයකි.

සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

30. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය අනුව අර්ථ නිරූපනය කළ යුතු ය.

09 - 452

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.